# මාසික මහ සභා රැස්වීම - 2022/07/12 දින

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/07/12 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 52 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**<u>මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා</u>**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තෑව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**<u>මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා</u>**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රීයානි වසන්තා රත්නායක මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 52 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත් අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

**01. <u>2022/06/15 දින මහ සභා වාර්තාව ස්ථිර කිරීම.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.06.15 දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.06.15 දින පැවති VI වන සැසිවාරයේ 51 වන මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ස්ථිර කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>

i. සභා වාර්තාවේ 06 වන පිටුවේ අංක 05.2 යෝජනාව යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ **"**පී.බී. වැත්තැව මැතිතුමා යනු මේ ප්‍රදේශයේ බිහි වූ මහජන මන්ත්‍රීවරයෙක්.**"** යනුවෙන් සඳහන් වී ඇති ප්‍රකාශය **"**පී.බී. වැත්තැව මැතිතුමා යනු මේ ප්‍රදේශයේ බිහි වූ **අවංක, නිහතමානී** මහජන මන්ත්‍රීවරයෙක්.**"** යනුවෙන් සංශෝධනය විය යුතුය.

**02.**<u>ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**02.1** අලව්ව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (i) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ ඇතුලත් මතය අනුව මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිඹු කරන බව සඳහන් කර ඇත. ඒ බව ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**02.2** දැනට දේශපාලන අධිකාරියක් ක්‍රියාත්මක එකම ආයතනය ප්‍රාදේශීය සභාව බැවිනුත් මේ වන තෙක් ඔබ සියළු දෙනාගේ සහයෝගය ඇතිව සභා කටයුතු සිදු කරමින් පවතින අතර ප්‍රාදේශීය සභා සභාපතිවරයා ලෙස අවසන් දිනය දක්වාත් ඔබ සියළු දෙනා ඒකරාශී කරගෙන කටයුතු කිරීම මාගේ වගකීමක්. විශේෂයෙන් 2023 වර්ෂය සඳහා වූ අයවැය සම්බන්ධයෙන් සහ මේ අවස්ථාවේ රට මුහුණ දී ඇති ගැටළුකාරී තත්වයත් සමඟ ප්‍රාදේශීය සභාවේ ඉදිරි කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධ තීන්දු තීරණ ලබා ගැනීමට සභාවේ සර්ව පාක්ෂික කමිටුවක් පත් කිරීම සුදුසු බවට මම අදහස් පල කරනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අදහස් හා සුදුසු අය මෙම කමිටුව සඳහා පත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ පිළිබඳව අපිට හරියාකාරව තේරුනේ නෑ. සර්වපාක්ෂික සභාවක් ලෙසද දැන් සභාව ගෙනයන්නේ.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

නීත්‍යානුකූලව සභාපති ධූරයේ වෙනස් වීමක් සිදුවෙලා නෑ. මේ තීරණය ගෙන තිබෙන්නේ පවතින තත්වයත් සමඟ තීන්දු තීරණ ගැනීමටත් අයවැය සකස් කිරීමේදී අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් සියළු දෙනාගේ සහභාගීත්වය අවශ්‍ය යැයි කියන හැඟීම මතයි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ තීරණය ගෙන තිබෙන්නේ ඔබතුමියගේ කැමැත්තට ද, එසේ නොමැති නම් කොමසාරිස්තුමා දැනුවත් කරල තිබෙනවද?

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

එසේ කවුරුත් දැනුවත් කර නෑ. මෙතෙක් සභාව පවත්වාගෙන ආ විදිය කල්පනා කර මේ සභාව පවත්වාගෙන යාමටයි මේ තීරණය ගත්තේ.මේක මගේ යෝජනාවක්

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ආණ්ඩු පක්ෂයේ කණ්ඩායමක් සිටිනවා. ඒ අයත් සමඟ කතා කරලා මෙය සංවිධානය කල යුතුව තිබුණා. අපට එක්වරම කිව්වම අපි කොහොමද තීරණයක් ගන්නේ?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ රටේ 69 ලක්ෂයක් ජනතාව ඡන්දය දුන්නේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට. නමුත් එතුමන්ලා තනි මතයට වැඩකරලා රට විනාශ කලා. එතකොට මේ ප්‍රාදේශීය සභාවෙත් මීට කලින් සර්වපාක්ෂික කමිටු තිබුනද? මේකෙ දෙතුන්දෙනයි හැමදාම වැඩකරගත්තෙ. අපේ පාරවල් කවදාවත් හැදුනෙ නෑ. මේ සර්වපාක්ෂික කමිටු කියන්නෙ බොරු. සර්වපාක්ෂික කමිටු අවශ්‍ය නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සර්වපාක්ෂික කමිටු හදන්න හදන්නෙ කා සමඟද. ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු එක්ක කතා කලාද? අපිට අවශ්‍ය රට හදන නායකයෙක්. සර්වපාක්ෂික කමිටු හදලා මොනවා ආරක්ෂා කරන්නද කියලා අපිට තේරෙන්නෙ නෑ. මේවා කාගෙ හරි උපදෙස්. දුටුගැමුණු රජ්ජුරුවන්ගෙන් පසු මේ රට බේරගත්ත වීරයා කියලා අපේ මිනිසුන් ඡන්දය දුන්නා. යුද්ධ කාලේ හැම ගමකටම මිනියක් එනවා. මේවා නවත්තපු නායකයා කියලා හිතලා මිනිස්සු ප්‍රාදේශීය සභාවේ ඡන්දෙ ඉල්ලපු පොහොට්ටුවේ හැමෝටම ඡන්දේ දුන්නා. ඒ මහින්ද රාජපක්ෂ මැතිතුමා හින්දා. එහෙම හිටපු කෙනෙක්, මල් තියලා වඳින්න ඕනෙ කෙනෙක්, ලංකාවෙ හැමතැනම පිළිම හදන්න ඕනෙ කෙනෙක්ට තමයි අද මෙහෙම වෙලා තියෙන්නෙ. මේ පාලකයො අපේ අනාගත පරපුර විනාශ කලා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අද මේ ඔක්කොම අවුල් කරලා පැනලා යන්න හදන්නෙ. රාජපක්ෂලාට බේරෙන්න ඕනෙ නිසා තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති කලේ. දැන් මේ වෙලාවේ කරන්න හදන්නෙ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති කරන්න. ඒක කාටවත් නවත්තන්න ලැබෙන්නේ නෑ. එතකොට කවුරු කෑ ගැහුවත් වැඩක් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මූලාසනය පිළිබඳව මම කණගාටු වෙනවා. න්‍යාය පත්‍රයක් තිබෙනවා නම් එයට අනුව කටයුතු කල යුතුයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

සභාවට අදාල දේ කතා කරන්න. අපිට පාර්ලිමේන්තුවේ දේවල් කතා කරන්න බෑ. සභාවේ රීති වලට අනුව කතා කරන්න. සභාවක් පවත්වන ආකාරයක් තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සර්ව පාක්ෂික කමිටුවක් හදන්න කලින් ඒ පිළිබඳව තවත් පැහැදිලි කරනවා නම් හොඳයි කියල හිතනවා. ඒ පිළිබඳ වඩා හොඳ පැහැදිලි කිරීමකින් පසු අපි අදහස් දක්වන්න කැමතියි. ඒත් එක්කම තවත් කරුණු දෙකක් පිළිබඳ අවධානය යොමු කරනවා. පසුගිය මැයි 09 ප්‍රහාරයේදී ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමාගේ නිවසටත්, ගරු සභාපතිතුමියගේ නිවසටත් හානි කිරීම පිළිබඳව ගරු නාරද මන්ත්‍රීතුමා ජනතා විමුක්ති පෙරමුණට චෝදනා කලා. මම ඔබතුමාට අභියෝග කරනවා ශාන්ත බණ්ඩාර මැතිතුමාගේ නිවසට හෝ සභාපතිතුමියගේ නිවසට ප්‍රහාර එල්ල කලේ ජනතා විමුක්ති පෙරමුණ කියලා පැමිණිලි කර ඔප්පු කරන්න.ඔප්පු කර රටේ නීතියක් තිබෙනවා, එම නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. අපි කිසිසේත්ම එම බාල

වැඩ කරන්නේ නෑ. එසේ කිරීමට අවශ්‍යත් නෑ. ඒත් එක්කම අපි දැක්කා ජූලි 09 වෙනිදා අරගලය වේලාවේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිවසට ගිනි තබනවා. අපි එයත් පිළිකුලෙන් යුක්තව හෙලා දකිනවා. එසේම ඔබතුමා කියනවා ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයා අයින් වූ පසු අග්‍රාමාත්‍යවරයා ජනාධිපති වෙනවා කියලා. නමුත් ජනාධිපතිතුමාට පුළුවන් අග්‍රාමාත්‍යතුමා අයින් කරලා එතුමාටත් අයින් වෙන්න.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ඔබතුමා සර්වපාක්ෂික කමිටුවක් පත් කරන්නේ ඇයි කියලා විමසුවා. කමිටුවක් පත්කරමු යැයි යෝජනා කලේ සභාව ආරක්ෂා කරගන්න. නැතිව වෙනත් කිසිමදෙයක් ආරක්ෂා කිරීම සඳහා නොවෙයි. මම පැහැදිලිවම පැවසුවා හෙට වෙනකොට සභාව විසුරුවන්න පුළුවන්. එසේ නොමැති නම් තව සතියකින් වෙන්නත් පුළුවන්. වෙනත් සභාපතිවරයෙක් වෙන්න පුළුවන්. මීට පෙර සභා වාරයේදීත් අපි කතා වුනා, කවුරුන් හෝ ඉදිරියට සභාව ගෙන යාමට මේ ඉන්න තමුන්නාන්සේලාගෙන් එක් අයෙක් මේ පුටුවේ වාඩි වෙයි. සභාව කියන්නෙ මහජනතාවට මෙහෙවර කරන තැනක්. එය ඒ ආකාරයටම යා යුතුයි. ඒ නිසා එයට අවශ්‍ය පසුබිම අපි අතින් හැදිය යුතුයි. කමිටු පත්කරමු යැයි යෝජනා කලේ පොහොට්ටුවක්වත්, මලක්වත්,ගෙඩියක්වත් ආරක්ෂා කරන්න නොවෙයි. ජනතාව වෙනුවෙන් තීරණ ගන්නයි. අයවැය කමිටුව පිළිබඳ කතා කිරීමේදී, රටෙත් සල්ලි නෑ. 2021 වසරේ සහ 2022 වසරේ මන්ත්‍රී යෝජනා ක්‍රියාත්මක නොවීම පිළිබඳව මගෙන් විමසන්න ඔබතුමාලා බලා සිටිනවා. මගේ යෝජනා ක්‍රියාත්මක වෙලත් නැහැ. මේ වාර්තා අරගෙන බලන්න. මීට පෙර හිටපු සභාපතිවරු සභා අරමුදලින් විවිධ වැඩ කොටස් කරලා තිබෙනවා. එම ප්‍රතිපාදන එක් එක් ආකාරයට බෙදිලා තිබෙනවා. සභාවේ හෝ මහා භාණ්ඩාගාරයේ මුදල් නෑ කියලා අපි නැවතිලා බෑ. අපි අයවැයක් හදලා රීතියට අනුව කටයුතු කිරීමට අවශ්‍යයි. ගරු උපසභාපතිතුමා ගිය වසරේ එම කාර්යභාරයට සහාභාගී වුනා. කවුරු ආවත් අපි ඉදිරියට යන්න සභාවටත් බලප්‍රදේශයේ ජනතාවටත් ගැලපෙන ආකාරයට නිසි අයවැයක් පිළියෙල කර තිබිය යුතුයි. කමිටුවක් හදමු කියලා යෝජනා කලේ එම කටයුතු ඉටු කිරීම සඳහායි. එසේ නොමැතිව කිසිම කෙනෙක් ආරක්ෂා කිරීමට නොවෙයි. සියළු දෙනාගේ යෝජනා ගමු කියලා කීවේ සභාව ආරක්ෂා කිරීම සඳහායි. එසේ නැතිව සභාව ඉදිරියට ගෙන යාමේදී විවිධ ප්‍රශ්න ගැටළු වලට මුහුන දෙන්න සිදු වෙනවා. ඒ නිසා එය පැහැදිලි කර දීමට පමණයි මෙම යෝජනාව ඉදිරිපත් කලේ. එයට අකමැති නම් ඒ සම්බන්ධයෙන් මීට වඩා කරුනු සාකච්ඡා කිරීම අනවශ්‍යයි. ඒ නිසා න්‍යාය පත්‍රය අනුව ඉදිරි කටයුතු සිදු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සර්වපාක්ෂික කමිටුවට මමත් විරුද්ධයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඇත්ත වශයෙන්ම ඔබතුමියගේ අපේක්ෂාව පිළිබඳව අපිටත් දැන් තමයි වැටහෙන්නෙ. අපිට මේ සඳහා මහජන නියෝජිතයන්ගෙන් උපදේශක මණ්ඩලයක් පත්කරගැනීමට අවස්ථාවකුත් තිබෙනවා. ඔබතුමියගේ චේතනාව තිබෙන්නේ අයවැය ආදායම් ගැටළුකාරී තත්වයකින් තොරව සභාව කියවීමයි. එය ඉතාම හොඳයි. මෙය ආණ්ඩු පක්ෂය එක් විදියකටත් විපක්ෂය තව විදියකටත් දකින්න පුළුවන්. මම බලන්නේ ඒ පක්ෂ විදියට නොවෙයි. මේ සභාවේ තිබෙන වාතාවරණයත් සමඟ එය හොඳයි කියන එක මගේ පෞද්ගලික මතයයි. මෙය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට යොමු කර අනෙක් අයත් සම්බන්ධ කරගෙන ඒ වෙනුවෙන් ගත යුතු තීරණ මොනවාද කියලා පුළුල් ලෙස සාකච්ඡා කර ඊළඟ සභා වාරයේදී මෙම කමිටුව ස්ථාපිත කරනවා නම් හොඳයි කියන එක මම ඔබතුමියට අවධාරණය කරනවා .

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

### 03.1 මාළු කඩය පෞද්ගලික ස්ථානයකට ඉල්ලුම් කිරීම.

අලව්ව නගරයේ 01, 02, 03 යන මාලුකඩ 2022 වසර සඳහා බදු ගෙන ඇති නො. 633/3, නාරම්මල පාර, අලව්ව ඒ.එල්.එස්. නිමාෂි මහත්මිය විසින් යොමු කර ඇති ලිපිය සභාවට ඉදිරිපත් කිරීම.

නො. 633/3, නාරම්මල පාර, අලව්ව ඒ.එල්.එස්. නිමාෂි මහත්මිය විසින් මා වෙත ලිපියක් ඉදිරිපත් කරමින් අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් අලව්ව නගරයේ මාළු කඩ අංක 01,02,03 යන මාළුකඩ 2022 වර්ෂය සඳහා තමන් විසින් ටෙන්ඩර් ලබාගෙන ඇති බවත් එම මාළු කඩ 03 සඳහා නියමිත ස්ථානය වූ අලව්ව බස්නැවතුම්පල ඉදිරිපිට භූමියෙහි වෙළදාමක් නොමැති බැවින් මේ වන විට එක් කඩයක් අලව්ව සතිපොල ඉදිරිපිට මාගේ පෞද්ගලික ඉඩමක පවත්වාගෙන යන බවත් මාළු කඩ තුන සඳහාම නියමිත පරිදි බදු මුදල් ගෙව්වද ඉන් දෙකක්ම නිසි වෙළදාමක් නැති ස්ථානයක පවතින බැවන් පවත්වාගෙන යා නොහැකි බැවින් අලව්ව නගරයේ ජනරජ මාවතේ අංක 02 කඩ මාවිසින් බදුගෙන ඇති අතර එම ස්ථානයේ මාළු විකිණීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ආදායම් පරීක්ෂක මහතා විසින් මෙම ස්ථානය අලව්ව නගර සීමාවට අයත් වන අතර අසල සැලුන් හලක් සහ කොමියුනිකේෂන් එකක් පිහිටා ඇති බවත් මාළු කඩ අංක 04 කඩය ලබාගත් ටෙන්ඩර්කරු ද සභාවේ අවසරය මත එම ස්ථානයේ මාළු වෙළදාම පවත්වාගෙන යන බවද වාර්තා කර ඇත. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අදහස් ලබා ගැනීමට එම ලිපිය සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මගේ මතකයේ හැටියට 2006 වසරේ ප්‍රාදේශීය සභාව පත්වීමේදී ගෙන ආ මංගල යෝජනාව තමයි අලව්ව මාළු කඩේ, මාළු ලැල්ලක් ලෙස සංවර්ධනය කිරීම. බල ප්‍රදේශයේ සියළුම පාරිභෝගික ජනතාවට තරඟකාරී මිලක් යටතේ හොඳ මාළු මිලදී ගැනීමටයි අපි කඩකාමර 04 ක් ස්ථාපිත කලේ. නමුත් එක් පුද්ගලයෙක් විවිධ නම් වලින් කඩකාමර 03 ක් මිලට ගෙන ඇති බව මෙම ලිපිය මගින් ඔප්පු වෙනවා. එතනම කොන්දේසි කඩවීමක් සිදු වී තිබෙනවා. අද මෙම ලිපිය භාර දී තිබෙන පුද්ගලයා මාකට් එකේ කඩකාමරයේ වෙළදාමක් නොමැති නිසා නාරම්මල පාරේ පෞද්ගලික ස්ථානයකට මාළු ලැල්ල ගෙනයාමට අවසර ඉල්ලූ විට ඔහුට උපදෙස් ලබා දී තිබුනේ දෙපස ව්‍යාපාරිකයින් විරුද්ධ නොවනවා නම් පමණක් මාළු ලැල්ල ගෙන ගියාට ගැටළුවක් නොමැති බවයි. ඒ අතර අග්බෝව ප්‍රදේශයේ මාළු ව්‍යාපාරිකයෙකුට වෙළඳාමක් නොමැති නිසා නගරයේ තැනින් තැන තියාගෙන වෙළදාම් කලා. අවසානයේ රේල් ගේට්ටුව අසල ලොරි රථය නවතාගෙන වෙළදාම් කිරීමට අවසර ලබා දීමට සභාව තීරණය කලා. මේ පුද්ගලයා පෙනෙන මානයේම ජනරජ මාවතේ තවත් මාළු වෙළඳසැලක් දැමීමට අවසර දුනහොත් එතන ගැටුමකට ආරම්භයක් වේවි. ඒ වගේම ජනරජ මාවතේ බහුතරයක් දෙනාගේ අදහස නැවත එම ස්ථානයේ මාළු ලැල්ලක් දැමුවහොත් මාළු ඉස්ම පාර දිගේ ගලාගෙන ගොස් ජනතාවට ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවන බවයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙයින් පෙනියන්නෙ නගරය තුළ ඔහු මාළු පිළිබඳ ඒකාධිකාරයක් ගොඩනගා ගැනීමට උත්සහ දරන බවයි. මම හිතන්නෙ, හොඳම දෙය තමයි සභාව මඟින් වෙන්කර ඇති කඩ කාමරවලට මේ ව්‍යාපාරය ගෙන යාම. මොකද එම ස්ථානයේ තිබෙන මාළු කඩ පවත්වාගෙන යාම තුලින් ඊලඟ අවස්ථාවේ ටෙන්ඩර් කිරීමේදී සභාවට වාසියක් මිසක් අවාසියක් වෙන් නෑ. තරඟකාරී වෙළදාමක් කරගන්නත් පුළුවන්.ඒ නිසා ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ප්‍රශ්නෙදි සභාව නීතියක් එක්ක යන ක්‍රමවේදයක් තියනවා. මේ ක්‍රමවේදය එක්ක සභාවෙ මාළු ලැල්ලට දෙන්නටම එන්න කීවා නම් ගැටළුවක් ඇති වෙන් නෑ. වෙනත් තැන්වල ඇති මාළු ලැලි තහනම් කරන්න. මේ දෙදෙනාම එක ළඟ මාළු වෙළදාම කරන්න ගත්තොත් දෙදෙනාටම සාධාරණයක් වෙයි. ඒක තමයි සුදුසුම දේ කියල මම විශ්වාස කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ටෙන්ඩර් මණ්ඩල ක්‍රියාවලිය අනුව මාළු ලැලිවල බදු හිමියන් රේල් පාර අසල ව්‍යාපාරය කරන ව්‍යාපාරිකයටත් හානි නොවන ආකාරයට තමන්ට හිමි ස්ථානයේ ව්‍යාපාරය කරන ලෙස දැනුවත් කිරීම සුදුසු යැයි මම හිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා සඳහන් කල පරිදි සභාව නියෝජනය කිරීමටත් පෙර සිටම අලව්ව මාළු ව්‍යාපාරය පිළිබඳව තිබුනේ ඒකාධිකාරයක්. 2006 ගාමිණී ගුණදාස මැතිතුමාගෙ කාලෙ තමයි මාළු කඩ තුන, තුන්දෙනෙක්ට එන ආකාරයට වෙන් කලේ. මම හිතනවා තරඟකාරී ක්‍රමයක් ඇති වුනොත් පාරිභෝගික ජනතාවට යම් සහනයක් ලැබෙයි කියල. අපි සභාවක් හැටියට ඒකාධිකාරයක් ඇති නොවන ආකාරයට කටයුතු කල යුතුයි. ඒ නිසා තරඟකාරී ක්‍රමය පිලිබඳ වඩාත් අවධානය යොමු කර මාළු කඩ තුන, තුන් දෙනෙකුට ලබා ගැනීමට හැකි වන ආකාරයට ක්‍රමවේදයක් සකස් කර දීම මඟින් පාරිභෝගික ජනතාවට මාළු මිලදී ගැනීමට වඩා හොඳ අවස්ථාවක් ලැබෙයි කියලා මමසිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනිඑච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මට මතකයි ජනරජ මාවතේ මාළු ලැල්ල තිබෙනකොට එතනින් පාරේ යන්න බැහැ. එම නිසා නගරයේ අලංකරණයත්, නගරයේ පිරිසිදුකමත් පිළිබඳ කල්පනා කරල බලලයි මාළු වෙළඳාම සඳහා තැනක් වෙන් කලේ. ඒ නිසා ඇත්තටම මම හිතනවා මාළු වෙළඳාම සඳහා වෙන් කල ස්ථානයට සියළු මාළු ව්‍යාපාරිකයන් එකතු කරනවනම් හොඳයි කියලා. මොකද අවශ්‍ය පහසුකම් ඇතිව පිරිසිදුකම සුරැකෙන ආකාරටයි එම ස්ථානය සකස් කරල තිබෙන්නෙ. එනිසා එම ස්ථානයට සියළු දෙනා යොමු කිරීම තමා සුදුසුම දේ කියල මම විශ්වාස කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

සභාවට විවිධ අවස්ථාවල පැමිණිලි ආව අග්බෝවේ වෙළඳ මහතාට වෙළඳාම සඳහා නිශ්චිත ස්ථානයක් නොමැති නිසා මෙන්ම එම පුද්ගලයා තැන් තැන් වල වෙළඳාම් කරන විට ජනතාවට සිදුවන අපහසුතා ගැන කියල. ඒ වගේම මගීන්ගේ පහසුව පිළිබඳවත් සලකා බලලයි ඒ පුද්ගලයට රේල් පාරෙන් එහා පැත්තෙ වෙළඳාම් කරන්න අවසථාව සලසලා දුන්නෙ.අපි ගොඩක් වෙලාවට කියනවා සියළු වෙළඳ කටයුතු පාලමෙන් එහා පැත්තට යනව කියල. පාලමෙන් එහා පැත්තෙ මාළු ලැල්ලක් තියනවා. මෙහෙන් මාළු ගන්න බැරිවෙන මිනිස්සු කරදරයක් නැතුව එහා පැත්තෙන් මාළු අරන් එනවා. එහා පැත්තට යන මිනිස්සුත් මෙතන මාළු තියනව දැක්කොත් අරගෙන යනවා. නැත්නම් එහා පැත්තෙන් ගන්නවා. ඒ නිසා මේ සභාවේ ආදායම ගැනත්, නගරයේ ඇති ව්‍යාපාරවලට බාධාවක් නොවෙන්නත් තමයි ඒ පුද්ගලයාට රේල් පාර එහා පැත්තෙ මාළු වෙළඳාමට අවසර ලබා දුන්නෙ. මේ ලිපිය ඉදිරිපත් කරන පුද්ගලයා කඩ තුනක් අරන් තියෙන ගමන් පෞද්ගලික ස්ථානයකත් වෙළඳාම් කරනවා. මේ ඉල්ලන තැනත් පෞද්ගලික ස්ථානයක්. ඒ නිසා සභාවේ නිලධාරීනුත් සාකච්ඡා කරල දැන් ඔබතුමාල දැක්වූ අදහසුත් අනුව රේල් පාරෙන් ඒහා පැත්තෙ මාළු වෙළඳාම කරගෙන යන පුද්ගලයාට ඊලඟ ටෙන්ඩරය එන තෙක් එය කරගෙන යාමටත්, මේ ලිපිය ඉදිරිපත් කරන පුද්ගලයාට මෙතෙක් ව්‍යාපාරය කරගෙන ආ තැනම ව්‍යාපාරය කරගෙන යාමටත් අවසර ලබා දිම සුදුසු යැයි මම යෝජනා කරනවා. ඒ වගේම මීට පෙර සභා වාරවල යෝජනා වෙලා තිබෙනවා මස්, මාළු වෙළඳසැල්වල පිටුපසට යාමට ඉඩ නොමැති නිසා ඉදිරිපසින් හරස් අතට ඇති ස්ථානයේ කඩ කාමර ගැලපෙන ආකාරයට හදමු කියලා. නමුත් සභාවේ මුදල් නොමැති නිසා එම කටයුතු කිරීමට නොහැකි වුණා. ඉදිරියේදී ඒවා ඒ ආකාරයට කරගෙන යාමට සභාවට පුළුවන් වේවි.

ඒ අනුව අදාල ඉල්ලීම සඳහා සභාවේ අනුමැතිය නොලැබුනු අතර මේ සම්බන්ධයෙන් තව දුරටත් සොයා බලා මාළු ලැලි පවතින ස්ථානයට පරිබාහිරව පෞද්ගලික ස්ථානවල මාළු වෙළඳාම සිදුකිරීමට අවසර ලබා දිම නුසුදුසු බව තීරණය විය.

**03.2**<u>**ටෙන්ඩර් ගාස්තුව අඩු කර ගැනීම සඳහා.**</u>

අලව්ව පොදු වෙළඳපලෙහි එළහරක් මස් කඩය සහ එළුමස් කඩය බදු ලබාගෙන ඇති ඒ.ඩබ්.එම්. රවුෆ් මහතා විසින් ඇදිරි නීති කාල සීමාව නිසා එනම් 2022.05.09 සිට 2022.05.12 දින දක්වා සහ වෙසක් පොහොය නිමිත්තෙන් එම මසම 13 දින සිට 17 දින දක්වා කාලය තුළ

තමන් බදුගෙන ඇති එම කඩ වසා තිබුණු බැවින් ඒ සඳහා ඇති ටෙන්ඩර් ගාස්තුව සම්බන්ධයෙන් යම් සහනයක් ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇති අතර ආදායම් පරීක්ෂක විසින් මෙම කාලය තුළ වෙළදාම් කටයුතු නොපැවතුනු බවත් වාර්තා කර ඇත. ඒ අනුව ඉහත සඳහන් කාලයට අදාළ ගාස්තු අඩු කර සහනයක් ලබාදීම සම්බන්ධ තීරණයක් ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ඉල්ලීම කර ඇති පුද්ගලයා සභාවේ බදු මුදල් නිසියාකාරව ගෙවන නිසා ඔහුට මේ බදු සහනය ලබා දීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම හිතන්නෙ ඒ සහනය ලබා දිය යුතුයි. නමුත් අපිට ගැටළුවක් තිබෙනවා. මෙවැනි බදු ගෙවන තවත් ව්‍යාපාරිකයන් මේ හේතුව හේතුකොටගෙන මෙවැනි ලිපි ඉදිරිපත් කලොත් අපි සභාව සහ අපේ ආදායම් තත්වය ඉදිරියට ගෙනියන්නෙ කොහොමද කියන ගැටළුව මතු වෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මෙවැනි අවස්ථාවක් ආපු පලවෙනි වතාව නොවෙයි. මීට පෙර සභා වාරවලදීත් මේ ආකාරයටම මේ වගේ දේවල් කලා. කොරෝනා අවස්ථාවලදීත් මේ වගේ තීන්දු ගත්තා. ඒ වගේම පෝය දිනවල වසා තබන්න සිදුවන බව බදු ගිවිසුම්වල සඳහන් කරලා තිබෙනවා. ඒ හැර විශේෂිත අවස්ථාවක් ආවොත් ඒ ඒ ව්‍යාපාරය අනුවයි අපි ඒ තීන්දුව ගන්නේ. සමහර අවස්ථාවල පවත්වාගෙන යා හැකි ව්‍යාපාර මෙන්ම පවත්වාගෙන යා නොහැකි ව්‍යාපාරත් තිබෙනවා. මිනිසුන්ට පෞද්ගලිකව ප්‍රශ්න ඇතිවන අවස්ථා තිබෙනවා. ඒ අනුව ඒවා මුදල් කමිටුවට යොමු කර සාකච්ඡා කරලයි ඒ තීන්දු ගන්නේ.

ඒ අනුව ගිවිසුම් කොන්දේසි ද සලකා බලා ලබා දිය යුතු සහන ලබාදීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කළ අතර එම සහනය කොපමණද යන්න සම්බන්ධයෙන් තීරණයක් ලබාගැනීමට වාර්තාවක් මුදල් කමිටුවට ඉදිරිපත් කිරීම සුදුසු බවට තීරණය විය.

**03.3**<u>අලව්ව නගරය සුරැකීමේ සංවිධානය විසින් යොමු කර ඇති ලිපිය</u>

අලව්ව නාරම්මල ප්‍රධාන මාර්ගයේ සමූපාකාර තොග ගබඩාව සහ සරසවි සිනමාහළ අසල රජය සතු බිම් කොටස සඳහා කූඨ ලේඛන සකස් කර ඇති බවට අලව්ව නගරය සුරැකීමේ සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව නාරම්මල ප්‍රධාන මාර්ගයේ සමූපාකාර තොග ගබඩාව සහ සරසවි සිනමාහළ අසල රජය සතු බිම් කොටස සඳහා කූඨ ලේඛන සකස් කර ඇති බවට අලව්ව නගරය සුරැකීමේ සංවිධානය විසින් මා වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කරුණු සොයා බලා එම ඉඩම ප්‍රාදේශීය සභාවට පවරාගන්නා ලෙස ඉල්ලීමක් කර ඇත. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අදහස් යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගරු අතුකෝරල මන්ත්‍රීතුමා දන්නවා අපි රජයේ දේපල රකින්න හැදුවේ කොයි ආකාරයෙන්ද කියලා. මෙහිදී කූඨ ලේඛන සකස් කිරීම පිළිබඳ හිටපු ප්‍රාදේශීය ලේකම් බෙලිගොල්ල මැතිතුමාට හා එවකට ආණ්ඩු පක්ෂ සංවිධායක වූ මට චෝදනා ඇවිල්ල තිබෙනවා. මම ඉල්ලීමක් කරනව මේ සභාවේ ඒකච්ඡන්දයෙන් සම්මත කරල යෝජනාවක්

හැටියට වත්මන් ප්‍රාදේශීය ලේකම්තුමියට යවන්න. මේ ඉඩමට කූඨ ලේඛනයක් සකස් කරල තිබෙනවා නම් කූඨ ලේඛන සකස් කරපු සේවකයන් හොයල ඒ සම්බන්ධයෙන් ගරු අධිකරණයට කරුණු වාර්තා කරල මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුනම් ප්‍රාදේශීය ලේකම්ටත්, සභාව සතුනම් අපටත් පුළුවන් නඩුවකට යන්න. විශේෂයෙන්ම අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කිසියම් වූ රාජ්‍ය දේපලක් අවභාවිතා වෙලා තිබෙනවනම් එය නිවැරදි කර සමාජය සතු කිරීමේ වගකීම මහජන නියෝජිතයෝ හැටියට අපිට තිබෙනවා. ඒ වගේම මෙම ගැටළුව ප්‍රාදේශීය ලේකම්ට යොමු කරල අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කර මෙය නිවැරදි කරන ලෙස මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මොහාන් වික්‍රමනායක මැතිතුමාගෙ නම කියවුන නිසා මම මේකට උත්තරයක් දෙන්න ඕනෑ. මේ රජයේ ඉඩම් සම්බන්ධව එතුමා ලොකු කාර්යභාරයක් ඉටු කලා. ඒ නිසා එතුමා මේකට කිසියම් අනුබලයක් දීල ඇති කියලා මම හිතන්නේ නෑ. මම හිතන්නේ අපි නඩු මගට යාමට පෙර ප්‍රාදේශීය ලේකම්තුමියට ලිපියකින් දැනුවත් කරල අවශ්‍ය තොරතුරු ලබාගෙන සභාවට ඉදිරිපත් කරල ඒ පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කරනවනම් හොඳයි. ඒ වගේම අපි සභාව සතු වත්කම් ආරක්ෂා කර ගත යුතුයි. සුසාන භූමිවල වැටවල් සකස් කල යුතුයි. මේවට අපි අයවැයෙන් මුදලක් වෙන් කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔය ඉඩම ගැන මම හොඳටම දන්නවා. ඔය ඉඩමේ සෑහෙන ප්‍රමාණයක් වෙනත් අය අත්පත් කරගෙන තිබෙනවා. ඒ වගේම තුඹුල්ල කොට්ඨාශයේත් රජයේ ඉඩම් තිබෙනවා. ඒවාත් මිනිස්සු අයිති කරගෙන තිබෙන්නේ. එමෙන්ම මෙම ප්‍රශ්නය ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ කතා කරල ගරු මන්ත්‍රීතුමන්ලාත් එකතුකරගෙන සාකච්ඡා කරල වඩා හොඳින් පැහැදිලි කර ගමු කියලයි මගේ අදහස.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අප සභා බල ප්‍රදේශය තුළ රජයේ ඉඩම් තිබෙනවා නම් ඒවා ලබාගත යුතුයි. ඒ වගේම හුම්බුළුව කර්මාන්ත ශාලාව පිටුපස අක්කරයක පමණ ඉඩමක් තිබෙනවා. එය දැන් කර්මාන්තශාලාව විසින් වටකරගෙන තිබෙන්නේ. ඒ භූමියත් සභාවට පවරගන්න පුළුවන්කමක් තිබෙනවා නම් හොඳයි. මම මේ ගරු සභාවට යෝජනා කරනවා ප්‍රාදේශීය ලේකම්තුමිය මේ සභාවට ගෙන්නලා සියළු පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු කැඳවලා බල ප්‍රදේශයේ ඇති රජයේ ඉඩම් පිළිබඳ පැහැදිලි කරල දීල ඒවා රජයට පවරා ගැනීමට කටයුතු කල යුතුයි කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, දැන් තිබෙන නීති ප්‍රතිපාදන අනුව හොරට ඔප්පුවක් හදන්න අමාරුයි. චෝදනාවට අනුව ප්‍රාදේශීය ලේකම්තුමාගෙ හෝ අදාල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිතුමාගේ සහයෝගය මෙකට තියෙන්නම ඕනෑ. එසේ නොමැති නම් රජයේ ඉඩමකට ඔප්පුවක් හදන්න බෑ. ඒ නිසා අපි ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කරල එතුමියගෙ මාර්ගයෙන් ග්‍රාම නිලධාරිතුමා දැනුවත් කරල මේ සම්බන්ධව කටයුතු කරමු යන්නයි මගේ අදහස.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සභාවක් හැටියට අපි රජයේ ඉඩම් ටික වෙන් කරල ආරක්ෂා කර ගැනීම කල යුතුයි. මෙතන හොඳ පණිවිඩයක් දීල තිබෙනවා. ඔබතුමියට සමූපකාරයත් සිනමා ශාලාවත් අතර ඇති මේ රජයේ ගොඩනැගිලි ඉඩම් කැල්ල සභාව සතුද එසේ නොමැති නම් ප්‍රාදේශීය ලේකම් සතුද යන්න පිළිබඳ සොයා බැලීම කල හැකියි. එම කටයුත්ත සඳහා ග්‍රාම නිලධාරිතුමා හෝ ප්‍රාදේශීය ලේකම්තුමිය හෝ සම්බන්ධ කරගත හැකියි. මේ ලිපිය නගරය සුරැකීමේ සංවිධානයෙන් එවල තිබෙන්නේ. අපි මේ සඳහා ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඔවුන් අපි

දිහා බලාගෙන සිටිනවා. ඒ නිසා අපිට මේ සඳහා යම් පියවරක් ගන්න පුළුවන්නම් වඩා වැදගත් වේවි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පළාත් පාලන ආයතන ස්ථාපිත වූ දා සිට මේ දක්වා අපේ ආයතනයට ඉඩම් නෑ. තාම තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුවයි. අපි මේ සභාවේ කොපමණ කතා කලත් අපිට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නීතිමය පැත්තෙන් අපිට ඉඩ ලබා දී නෑ. අපිට අයිති වුනත් බොහෝ ඉඩම් වල ඔප්පු අපි සතුව නෑ. අපි මේ පිළිබඳ කටයුතු කරන්න යන බොහෝ අවස්ථාවලදී බාධක මතු වෙනවා. ඒ බාධක අපි ලිහාගත යුතුයි. මේ ප්‍රශ්නය වුනත් දීර්ඝකාලීනව තිබෙන ප්‍රශ්නයක්. මම දන්න තරමට මෙය නැවත අපිට ගන්න පුළුවන් ක්‍රමවේදයක් නෑ. එහෙම වෙන්න හේතුව අපි ලඟ සුරක්ෂිත විය යුතු දේ අපි සුරක්ෂිත කරගෙන නෑ මෙන්ම ඒවාට වගකීමක් දීලා නෑ.

ඒ අනුව මෙම ඉඩම සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් පැහැදිලි කිරීමක් ලබා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

## 04. <u>යථා පරිදි කල් දීඇති ප්‍රශ්න - නැත</u>

## 05. <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u>

**(05-1)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/52 - 01 දරණ යෝජනාව</u>**
**<u>2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම.</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් අලව්ව ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයේදී බලාත්මක කරන ලද සතෝක්ෂණය කිරීම 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වනවගන්තියේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2023 වර්ෂය සඳහා රුපියල් දහය (රු.10) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1V (ආ) වන කොටසේ 1989.03.10 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත, 2023 වර්ෂය සඳහා රුපියල් පනහ (රු.50) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළයුතු යයි ද අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-2)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/52 - 02** දරණ යෝජනාව</u>

**<u>2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම.</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 16 59 හා 2010.06.18 දිනැති ගැසට් පත්‍රය යටතේ ප්‍රාදේශීයසභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල,ගොඩනැගිලිවල,ඉඩම්වල,ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා2016 වර්ෂයේ සිදුකරන ලද තක්සේරුව 2023 වර්ෂයේ තක්සේරුව ලෙස පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 (1) උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අයකිරීමටත්,

තවද, 2023 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද සමාන වාරික හතරකින් අලව්ව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්,

එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල වරිපනම් බදු මුදල අලව්ව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් 5% ක වට්ටමක්ද අලව්ව ප්‍රාදේශීය සභාව විසින් ලබාදිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**<u>උපලේඛනය</u>**

| **කාර්තුව** | **ගෙවිය යුතු දිනය** | **5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය.** |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2023.03.31 | 2023.01.31 |
| දෙවන කාර්තුව | 2023.06.30 | 2023.04.30 |
| තුන්වන කාර්තුව | 2023.09.30 | 2023.07.31 |
| හතරවන කාර්තුව | 2023.12.31 | 2023.10.31 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-3)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/52 - 03** දරණ යෝජනාව</u>

**<u>2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදුපැනවීම.</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උප ලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2023 වර්ෂයේ දී පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි 11 වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමට අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**<u>උපලේඛනය</u>**

| <u>1 වන තීරුව</u> | <u>11 වන තීරුව</u> |
|---|---|
| (1) (i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් කරත්තයක්, පින්රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම | |

වාහනයක් සඳහා රු. 25.00

(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -

(අ) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් රු. 18.00

(ආ)වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් රු. 4.00

(iii) සෑම කරත්තයක් සඳහා රු. 20.00

(iv) සෑම අත්කරත්තයක් සඳහා රු. 10.00

(v) සෑම රික්ෂෝවක් සඳහා රු. 7.50

(vi) සෑම අශ්වයකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා රු. 15.00

(vii) සෑම ඇතෙකු සඳහා රු. 50.00

(2) විශ්කම්භය අඟල් 26 නො ඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-4)ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/52 - 04 දරණ යෝජනාව**
**2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම.**

(267 වන අධිකාරියවූ) විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුලත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥා පනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුල්වීම පිණිය කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට දහයකට (10%) සමාන බද්දක් පනවා 2023 වර්ෂය සඳහා අය කළයුතු යැයිද, මෙම යෝජනා සම්මතය ගැසට් පත්‍රයේ පල කරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළවන දින සිට ක්‍රියාත්මක විය යුතු යයිද, අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-5)ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/52 - 05 දරණ යෝජනාව**
**2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා සීමාව තුල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2010.07.16 දින අංක 1663 දරන ගැසට් පත්‍රයේ, වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් අනුමතකොට ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන ඒ

බව 2011.07.22 අංක 1716 ගැසට් පත්‍රයේ IV (අ) වැනි කොටසේ පලකරනු ලැබූ අතර, එම අතුරුව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රාදේශීය සභා සීමාව තුල වාහන නවතා තැබීම සම්බන්ධයෙන් පහත උපලේඛනය පරිදි ගාස්තුවක් 2022 වර්ෂය සඳහා අයකල යුතු බවත්, එකී ගාස්තුව ගෙවිය යුතු තැනැත්තෙකු විසින් 2023 අප්‍රෙල් මස 31 දිනට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

<u>උපලේඛනය</u>

| | | රු. ශත |
|---|---|---|
| 01. | වාහනය ලියාපදිංචි කිරීමේ ගාස්තුව | 100.00 |
| 02. | කාර්,වෑන් සහ ත්‍රී රෝද රථ සඳහා මාසික ගාස්තුව | 100.00 |
| 03. | බර වාහන සඳහා මාසික ගාස්තුව | 125.00 |
| 04. | ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සඳහා මාසික ගාස්තුව | 75.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා සීමාව තුල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05-6)ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/52 - 06 දරණ යෝජනාව</u>**

**<u>2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම විෂයෙහි බදු අයකිරීම.</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුල පිහිටි යම් ඉඩමක් වෙන්දේසි කරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) සමාන බද්දක් හා අංක 1882/22 හා 2014.10.01 දිනැති ඉඩම් කට්ටිකිරීමේ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 15 වන වගන්තියේ සඳහන් සංවර්ධන සැළැස්ම හෝ අනු බෙදුම අනුමත කරවා ගැනීම සඳහා පරීක්ෂණ ගාස්තු වශයෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අයකලයුතු බවටත්, එකී බදු හා ගාස්තු කොන්ත්‍රාත් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**(එසේ උවද, නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයටපත්කර ඇති ප්‍රදේශවල ගොඩනැගිලි සැලැසුම් අනුමත කිරීමේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 223554-2021/07/08 අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි වල සඳහන් ගාස්තු අයකල යුතුය)**

<u>උපලේඛනය</u>

| <u>ඉඩමේ ප්‍රමාණය</u> | සංවර්ධන සැළැස්ම අනුමත <u>කිරීම සඳහා ගාස්තුව</u> | අනු බෙදුම අනුමත <u>කිරීම සඳහා ගාස්තුව</u> |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| හෙක්ටයාර් 01 ට අඩු | 500.00 | 500.00 |
| හෙක්ටයාර් 01 ට වැඩි 02 දක්වා | 700.00 | 700.00 |
| හෙක්ටයාර් 02 ට වැඩි 04 දක්වා | 1000.00 | 1000.00 |
| හෙක්ටයාර් 04 ට වැඩි | 1250.00 | 1250.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම විෂයෙහි බදු අය කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**(05-7)ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/52 - 07 දරණ යෝජනාව**

**2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අයකිරීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122(අ)වගන්තිය සමග කියවිය යුතු 122 සහ126 වන වගන්තිවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, 1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින්, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන(සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා,අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන ඒ බව 1998.08.28 වැනි දින අංක 1043 ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළකරනු ලැබූ අතර, එම අතුරු ව්‍යවස්ථාවල 39 වැනි අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව, අලව්ව ප්‍රාදේශීය සභා සීමාව තුල යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**(එසේ උවද, නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 223554-2021/07/08 අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි වල සඳහන් ගාස්තු අයකල යුතුය)**

## උපලේඛනය

| ප්‍රචාරක දැන්වීම් විස්තරය | | අවසර පත්‍ර ගාස්තුව රු. ශත |
|---|---|---|
| 01. ප්‍රචාරක වෙළඳ දැන්වීමක්, පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් ස්ථානයක සවි කිරීමේදී එක් හතරැස් අඩියකට (ස්ථිර දැන්වීම් පුවරුවක්සඳහා) | - වසරකට | 150.00 |
| 02. යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකර ඇති හෝ මහජනතාවට දැනගැනීමට හැකිවන පරිදි හෝ යම් තැනක සවිකර තබන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට (තාවකාලික දැන්වීමක් සඳහා) | - මසකට | 50.00 |
| 03. වෙන්දේසි ඉඩම් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් හතරැස් අඩියකට | - මසකට | 100.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්/ දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අය කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**(05-8)ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/52 - 08 දරණ යෝජනාව**

**2023 වර්ෂය සඳහා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම**

වයඹ පළාත් සභාවේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල කරනු ලබන යම් ව්‍යාපාරයක්

සඳහා පරිසර බලපත්‍රයක් ලබාගත යුතු යම් තැනැතතෙකුගෙන්, පහත උපලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් හා පරීක්ෂණ ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අයකල යුතු බවටත්,එකී ගාස්තුව බලපත්‍රය ලබාගැනීමට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

<u>උපලේඛනය</u>

01.නියමිත පරිදි සකස් කරන ලද ප්‍රශ්නාවලිය සඳහා අයදුම්පත්‍ර ගාස්තුව රු. 100.00

| | |
|---|---|
| බලපත්‍ර අළුත්කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තුව | රු. 50.00 |
| බලපත්‍ර ගාස්තුව | රු. 1250.00 |

02. පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තුව :-
මූලික ආයෝජනය

| | |
|---|---|
| | රු. ශත |
| රු. 100,000.00 දක්වා | 250.00 |
| රු. 100,001.00 සිට 200,000.00 දක්වා | 500.00 |
| රු. 200,001.00 සිට 500,000.00 දක්වා | 1250.00 |
| රු. 500,001.00 සිට 1000,000.00 දක්වා | 2500.00 |
| රු. 1,000,001.00 සිට ඉහළට | 5000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා 1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ බලපත්‍ර ගාස්තු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-09)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/52 - 09 දරණ යෝජනාව</u>**
**<u>2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සහතික, ලබාදෙනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් සහතිකයක් හෝ සේවාවක් ලබාදීම සඳහා එම උපලේඛනයේ 11 වන තීරුවේ ඒ ඒ සහතිකය හෝ සේවාව සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2023 වර්ෂය සඳහා පනවා අයකල යුතු බවටත්, එකී සේවාව හෝ සහතිකය ලබාගන්නා යම් තැනැත්තෙකු විසින් ඒ සේවාව හෝ සහතිකය ලබාගැනීමට පෙර එම ගාස්තුව අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අලවිව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

<u>උපලේඛනය</u>

| <u>1 වන තීරුව</u> | | <u>11 වන තීරුව</u> |
|---|---|---|
| 01. වීථිරේඛා සහ නොපවරා ගැනීමේ සහතික, ගොඩනැගිලි සීමා සහතික | | |
| සහ හිමිකම් සහතිකයක් සඳහා | රු. 600.00 | |
| ඒ සඳහා වන තැන්පත් මුදල | | රු. 100.00 |
| 02. දේපල අයිතිය හැරවීම, වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීම | | |
| ඉල්ලුම්පත් හා වෙනත් සහතික පත්‍රයක් සඳහා | | රු. 250.00 |

03. ගොඩනැගිලි අනුකූලතා සහතිකයක් සඳහා රු. 1000.00

04. ගොඩනැගිලි අයදුම්පත්‍රවල වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම සඳහා රු. 1000.00

05. ගොඩැගිලි අයදුම්පතක් සඳහා රු. 500.00

06. ගොඩනැගිලි අයදුම්පත අනුමත කිරීමේදී පෙරසැරි ගාස්තු

| ගොඩනැගිල්ලේ විශාලත්වය (වර්ග අඩි) | වර්ග අඩියකට ගාස්තුව රු. නේවාසික | ව්‍යාපාරික |
|---|---|---|
| ❖ 500 ට අඩු | 1.00 | 1.50 |
| ❖ 501 - 1000 | 1.50 | 2.00 |
| ❖ 1001 - 2000 | 2.00 | 2.50 |
| ❖ 2001 - 3000 | 2.50 | 3.00 |
| ❖ 3001 - 5000 | 3.00 | 3.50 |
| ❖ 5001 - 10000 | 3.50 | 4.00 |
| ❖ 10000 ට වැඩි | 5.00 | 6.00 |
| ❖ උස අඩි 5 ට අඩු තාප්පයකට (දික් අඩි 1 ක් සඳහා) | 10.00 | 10.00 |
| ❖ උස අඩි 5 ට වැඩි තාප්පයකට (දික් අඩි 1 ක් සඳහා) | 15.00 | 15.00 |
| ❖ බැම්මක් බැඳීමට (දික් අඩි 1 ක් සඳහා) | 10.00 | 10.00 |

07. නීත්‍යානුකූල කළ හැකි අනවසර ඉදිකිරීම් නීත්‍යානුකූල කිරීමේ ගාස්තු.

(ඉහත සඳහන් ගාස්තු වලට අමතරව අයකරනු ලබන ගාස්තු)

| | වර්ග අඩියකට ගාස්තුව රු. නේවාසික | ව්‍යාපාරික |
|---|---|---|
| (අ). අත්තිවාරම අවසානය දක්වා ඉදිකර ඇතිවිට | 1.50 | 2.00 |
| (ආ). ඉදිකිරීම් අඩක් නිමකර ඇතිවිට | 2.00 | 2.50 |
| (ඇ). ඉදිකිරීම් නිම කිරීමෙන් පසු | 3.00 | 3.50 |

08.දුරකථන කුළුණු/ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම:-

උස මීටර් 5 -20 දක්වා රු. 20000.00 ක් සහ වැඩිවන සෑම මීටර් එකකටම රු. 100.00 බැගින්

131. ජල ටැංකි ආනයනය කිරීම, ගබඩාකිරීම හා අලෙවිකිරීම.
132. වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම.
133. තලකොල ආශ්‍රිත නිෂ්පාදනයන් කිරීම.
134. පොල් ලෙලි ආශ්‍රිත නිෂ්පාදනයන් කිරීම සහ එම නිශ්පාදන අපනයනය කිරීම.
135. වීදුරු උපයෝගී කරගෙන භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.
136. අබලිද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම.
137. ඉවත දමන රෙදිකැබලි උපයෝගී කරගෙන වෙනත් නිෂ්පාදනයන් කිරීම.
138. නිමි ඇඳුම් හා රෙදි ගබඩාකර තබාගැනීම.
139. ඉරන ලද දැව ගබඩාකර තබාගැනීම හා විකිණීම.
140. සංගීත භාණ්ඩ අලෙවිකිරීම.
141. සුපිරි වෙළඳසැල් පවත්වාගෙන යාම.
142. ගෘහභාණ්ඩ අලෙවිකිරීම.
143. සෙල්ලම්බඩු අලෙවි කිරීම.
144. කොහු ඉදල් නිෂ්පාදන මඩුවක් පවත්වාගෙන යාම.
145. සී.සී.ටී.වී කැමරා සවිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
146. භාණ්ඩ ආනයනය කිරීම, ගබඩාකිරීම හා බෙදාහැරීම
147. රට උළු,ගඩොල්,කළුගල්,බ්ලොක් ගල් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
148. රන් බඩු නිශ්පාදනය කිරීමේ සහ ගබඩාකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
149. පොල් ලී පැලීම සහ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
150. මල් පෝච්චි නිෂ්පාදන සහ අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
151. අභ්‍යාස පොත් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
152. මැණික් වෙළඳුන් සඳහා මැණික් කපන, ඔපදමන ස්ථානයක් පවත්වාගෙන යාම.
153. කොන්ක්‍රීට් ගඩොල් ඇතුළු වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිපදවීම හා විකිණීම.
154. ගෙතුම් හා ඇඟළුම් නිශ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
154. උපදේශන සේවා සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
155. අන්තර් ජාතික සහතික සහතික නිකුත් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
156. පානීය ජල බෝතල් නිශ්පාදනය හා බෙදාහැරීම.
157. අන්තර් ජාලය ඔස්සේ භාණ්ඩ ගෙන්වීම හා බෙදාහැරීම.
158. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
159. වාහන මිලදීගැනීම හා විකිණීම.
160. ඔන්ලයින් තාක්ෂණය යටතේ පංති පැවැත්වීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**(05-18)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/52 - 18** දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රාදේශීය සභාව සතු වත්කම් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවා බදු දීමට අදාලව ටෙන්ඩර් ලේඛනය මේ සමඟ ඉදිරිපත් කරන අතර එම ලේඛනයෙහි සඳහන් වත්කම් 30 (අලව්ව ප්‍රධාන කාර්යාලයේ 13 , මහරච්චිමුල්ල උප කාර්යාලයේ 07 , කැප්පිටිවලාන උප කාර්යාලයේ 08) 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලයට අදාලව බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| අ.අ | වත්කම් විස්තරය | **2022** වර්ෂයේ අවම ලංසුව | **2022** වර්ෂයට බදු ලබා ගත් මුදල | **2023** වර්ෂයේ අවම ලංසුව |
|---|---|---|---|---|
| | අලව්ව ප්‍රධාන කාර්යාලය | | | |
| 01 | අලව්ව සතිපොල ආපනශාලාව(තාවකාලික) | 45000.00 | 45000.00 | **45000.00** |
| 02 | අලව්ව සතිපොල පොදු වැසිකිලිය (තාවකාලික) | 20000.00 | 20000.00 | **20000.00** |
| 03 | අලව්ව පොදු වෙළඳපොල එළහරක් මස් කඩය **(10% ටෙන්ඩර් ගාස්තු වැඩිවීමේ පදනමට අවු :03 දක්වා 2023-2025)** | 770000.00 | 900000.00 | **1000000.00** |
| | අලව්ව පොදු වෙළඳපොල කුකුල් මස් කඩය **(10% ටෙන්ඩර් ගාස්තු වැඩිවීමේ පදනමට අවු :03 දක්වා 2023-2025)** | 65560.00 | 65600.00 | **72116.00** |
| | අලව්ව පොදු වෙළඳපොල ඌරු මස් කඩය **(10% ටෙන්ඩර් ගාස්තු වැඩිවීමේ පදනමට අවු :03 දක්වා 2023-2025)** | 153890.00 | 154000.00 | **169279.00** |
| 04 | අලව්ව පොදු වෙළඳපොල එළු මස් කඩය | 24530.00 | 50000.00 | **26983.00** |
| 05 | අලව්ව බස් නැවතුම්පල පොදු වැසිකිලිය | 79200.00 | 39600.00 | **79200.00** |
| 06 | අලව්ව දුම්රියපොල පොදු වැසිකිලිය | 58410.00 | 29205.00 | **58410.00** |
| 07 | 1 කණුව හපුගහගෙදර මාළු ලැල්ල | 29260.00 | 51568.95 | **32186.00** |
| 08 | වළකුඹුර දුම්රිය හරස් මාර්ගය අසළ මාළු ලැල්ල | 4400.00 | 4500.00 | **4840.00** |
| 09 | අලව්ව නගරයේ මාළු කඩ අංක 01 | 100000.00 | 208500.00 | **110000.00** |
| 10 | අලව්ව නගරයේ මාළු කඩ අංක 02 | 100000.00 | 110000.00 | **110000.00** |
| 11 | අලව්ව නගරයේ මාළු කඩ අංක 03 | 100000.00 | 110000.00 | **110000.00** |
| 12 | අලව්ව නගරයේ මාළු කඩ අංක 04 | 100000.00 | 257000.00 | **110000.00** |
| 13 | ගල්වාරම සැනසුම පියස සහා ඉඩමේ පොල් එලදාව | 1936.00 | 2200.00 | **2129.60** |

| | | | | |
|---|---|---|---|---|
| | මහරච්චිමුල්ල උප කාර්යාලය | | | |
| 01 | මහරච්චිමුල්ල නගරයේ මාළු ලැල්ල | 31286.00 | 32200.00 | **34414.60** |
| 02 | පඹදෙනිය නගරයේ මාළු ලැල්ල | 4840.00 | 6600.00 | **5324.00** |
| 03 | මොරවලපිටිය හංදිය මාළු ලැල්ල | 4807.00 | 23000.00 | **5287.70** |
| 04 | කොට්ටාවත්ත හංදිය මාළු ලැල්ල | 5324.00 | 5500.00 | **5856.40** |
| 05 | කන්දෙගෙදර මාළු ලැල්ල | 8784.60 | 8900.00 | **9663.06** |
| 06 | උරුලැමුල්ල හංදිය මාළු ලැල්ල | 7804.50 | 23000.00 | **8584.95** |
| 07 | නාරම්මල පාර 5 කණුව අසළ මාළු ලැල්ල | 4598.00 | 4700.00 | **5057.80** |
| | කැප්පිටිවලාන උප කාර්යාලය | | | |
| 01 | බෝයවලාන සතිපොල | 30800.00 | 0.00 | **33880.00** |
| 02 | බෝයවලාන නගරයේ කුකුල් මස් කඩය | 18150.00 | 20500.00 | **19965.00** |
| 03 | බෝයවලාන නගරයේ ඌරු මස් කඩය | 8470.00 | 10500.00 | **9317.00** |
| 04 | බෝයවලාන සතිපොල භූමියේ මාළු ලැල්ල | 23413.50 | 23450.00 | **25754.85** |
| 05 | හුම්බුළුව නගරයේ මාළු ලැල්ල | 5263.50 | 5300.50 | **5789.85** |
| 06 | 6 කණුව ට්‍රයිස්ටාර් ආයතනය ඉදිරිපිට මාළු ලැල්ල | 5555.00 | 5600.00 | **6110.50** |
| 07 | මොරටු කන්ද සුසාන භූමියේ පොල් එලදාව | 13068.00 | 15100.00 | **14374.80** |
| 08 | ඉඹුල්ගොඩ ගල්කඩුල්ල හේන කැබලි අංක 01 | 1100.00 | 5500.00 | **1210.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාව සතු වත්කම් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවා බදු දීමට අදාලව ඉහත ටෙන්ඩර් ලේඛනයෙහි සදහන් වත්කම් 30 (අලව්ව ප්‍රධාන කාර්යාලයේ 13 , මහරච්චිමුල්ල උප කාර්යාලයේ 07 , කැප්පිටිවලාන උප කාර්යාලයේ 08)2023.01.01 සිට 2023.12.31 දක්වා කාලයට අදාලව ඉහත සදහන් අවම ලංසුව පිලිගැනීමටත් ඒ අනුව එම වත්කම් බදු දීම සදහා ටෙන්ඩර් කැඳවීමට අනුමැතිය ලබා දීමත් සුදුසු බවටත් ඒකමතිකව සහා සම්මත විය.

**(05-19)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/52 - 19 දරණ යෝජනාව</u>**

පහත නම් සඳහන් අය දෛනික පදනම මත අප සභාවේ සේවය කරන අතර ඔවුන්ගේ ගිවිසුම් කාලය 2022 සැප්තැම්බර් මස අවසන් වන බැවින් ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| | නම | තනතුර | අවසන් දිනය |
|---|---|---|---|
| 1. | ඒ.නිමාලි ශෝභා තිලකරත්න | පුස්තකාල සහායක | 2022.09.16 |
| 2. | ඒ.එල්.ඒ. විජේකුමාර | ආදේශක ක්ෂේත්‍ර කම්කරු | 2022.09.01 |
| 3. | ඩබ්.එම්.ඒ.පී.කේ. ජයසූරිය | ආදේශක රියදුරු | 2022.09.03 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත නම් සඳහන් අයගේ සේවා කාලය ගිවිසුම් කාලය අවසන් වන දින සිට තවත් මාස 06 කින් දීර්ඝ කර කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-20)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/52 - 20 දරණ යෝජනාව</u>**

2022.02.28 දින පැවති කළමනාකරණ කමිටු තීරණ අනුව අලව්ව ප්‍රාදේශීය සභා භූමියේ විවිධ ස්ථාන වල ඉන්වෙන්ට්‍රි ලේඛන වල සටහන් නොවූ විවිධ භාණ්ඩ ගොඩ ගැසී ඇති බව පෙන්වා දෙන ලදී. ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාව විසින් පාවිච්චි කර ඉවත් කරන ලද අබලි තත්වයේ ඇති මෙම භාණ්ඩ වෙන්දේසි කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සඳහන් වී නොමැති භාණ්ඩ ලේඛනය</u>**

| අනු අංකය | භාණ්ඩ වර්ගය | කිව යුතු කාරණා | ප්‍රමාණය | තක්සේරු වටිනාකම රු. |
|---|---|---|---|---|
| 01 | ලී ලියන මේස | පාවිච්චි කරන ලද අබලි තත්වයේ | 04 | 8000.00 |
| 02 | වේවැල් පුටු | ” | 01 | අබලි |
| 03 | කුෂන් යකඩ පුටු | ” | 03 | 800.00 |
| 04 | තිර රෙදි රැඳවූ යකඩ බාර් | ” | 08 | 2000.00 |
| 05 | තිර රෙදි රඳවන බාර් | ” | 02 | 3000.00 |
| 06 | අහල් 02 ගැල්වනයිස් බට (රදවාගන්නා ලදී) | ” | 01 | |

| | | | | |
|---|---|---|---|---|
| 07 | 8x4 ප්ලයිවුඩ් බෝඩ් | ” | 01 | 3000.00 |
| 08 | 2x4 අඩි 09 ලී කෑලි | ” | 05 | 900.00 |
| 09 | 2x4 අඩි 06 ලී කෑලි | ” | 01 | 600.00 |
| 10 | 2x3 අඩි 03 ලී කෑලි | ” | 01 | 300.00 |
| 11 | රේඩියේටර් | ” | 01 | 500.00 |
| 12 | කැඩුනු රබර් හෝස් | ” | 01 | අබලි |
| 13 | කටු කම්බි රෝල් (බෝයවලාන වගා භූමියේ වැට ගැසීමට රැගෙන යන ලදී) | ” | 06 | |
| 14 | ¼ කම්බි | ” | 15kg | යකඩ බරට |
| 15 | ¼පට්ටන් (මුට්ටු කල කුෂන් පුටුවලින් ඉවත් කල) | ” | | යකඩ බරට |
| 16 | අඟල් 3 ගැල්වනයිස් බට (රදවාගන්නා ලදී) | ” | 03 | |
| 17 | L හැඩයේ බට, අඩි 2 ½ , අඩි 10 (රදවාගන්නා ලදී) | ” | කෑලි 02 | |
| 18 | අඟල් 1 යකඩ බට දිග අඟල් 6 | ” | 01 | |
| 19 | කොටු දැල සහිත ලොකු කූඩු (ප්‍රේම්) | ” | 06 | 500.00 |
| | කොටු දැල සහිත කුඩා කූඩු (ප්‍රේම්) | ” | 01 | 1000.00 |
| | කොටු දැල රහිත කූඩු (ප්‍රේම්) | ” | 05 | 500.00 |
| 20 | අඟල් 1x9, අඟල් 6x9 දොර පියන් (හොඳ) | ” | 05 | 2000.00 |
| | අඟල් 1x9, අඟල් 6x9 දොර පියන් (කැඩුණු) | ” | 03 | 1000.00 |
| 21 | අඟල් 6x8 වීදුරු පියන් | ” | 02 | 1500.00 |
| 22 | ලී - සනකම 1 x¼<br>පළල අඩි 7, දිග අඩි 8 | ” | 71 | අඩියක් 100 |
| | ලී - සනකම අඟල් 6, පළල දිග අඩි 8 | ” | 05 | අඩියක් 100 |
| | ලී අඩි 4 | ” | කෑලි 08 | අඩියක් 100 |
| | ලී අඟල් 2 x9 | ” | කෑලි 01 | අඩියක් 100 |
| 23 | ලි රාමු - පළල අඟල් 1 x 10<br>දිග අඟල් 1 x 4 | ” | 01 | |
| 24 | ඇලුමිනියම් බෝර්ඩ් | ” | 02 | යකඩ බරට |
| 25 | අබලන් ජංගම වෙළඳ කුටි<br>( ලොතරැයි කුටි) | ” | 01 | |
| 26 | ඇලුමිනියම් ප්‍රේම් ,ඇලුමිනියම් දොර | ” | 02 | 4000.00 |
| 27 | කැඩුණු ඇස්බැස්ටෝර්ස් ෂීට් | ” | 27 | |
| 28 | දැන්වීම් පුවරු (රඳවාගන්නා ලදී) | ” | 03 | |
| 29 | අබලි තහඩු | ” | | තහඩු බරට 30kg |
| 30 | ගේට්ටු පියන් | ” | 05 | කිලෝ 1 ක් 150.00 |
| 31 | දෙපියන් සහිත ජනෙල් පියන්<br>කූරු දිග අඩි 03<br>පළල අඩි 03 | ” | 01 | |

| | | | | |
|---|---|---|---|---|
| 32 | දොර පියන් | ” | 01 | |
| 33 | වෙළඳ කුටි (අබලි රදවාගන්නා ලදී) | ” | 02 | |
| 34 | යකඩ ටැංකි ( සිලින්ඩරාකාර) | ” | 01 | 1කිලෝ 150.00 |
| 35 | පිඟන් රාක්ක | ” | 01 | 1කිලෝ 150.00 |
| 36 | උළු | ” | 7585 | කැටයක් රු.20 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාව විසින් පාවිච්චි කර ඉවත් කරන ලද අබලි තත්වයේ ඇති ඉහත සඳහන් භාණ්ඩ වෙන්දේසි කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-21)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/52 - 21 දරණ යෝජනාව</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ආර්ථික විද්වතුන් ප්‍රකාශ කරන පරිදි ඉදිරියේදි අප රටේ ඇතිවිය හැකි උග්‍ර ආර්ථික අර්බුධයට යම් පිළිසරණක් වීමේ අරමුණින් අප සභා බල ප්‍රදේශය තුල ගෙවතු වගා තරඟයක් ආරම්භ කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙම යෝජනාව කාලීන යෝජනාවක් හැටියට අපි හැමෝම දන්න කාරණයක්. විශේෂයෙන්ම පසුගිය සභාවේ වෙනත් කරුණු යටතේ මේ පිළිබඳ වඩාත් පුළුල් ලෙස අවධානය යොමු කලා. මේ යෝජනාව ඉතා හොඳින් සැලසුම් කර ක්‍රියාත්මක කරනවනම් හොඳයි. අපිට පෞද්ගලික දානපතියන්ගෙ සහයෝගය ලබා ගන්නත් පුළුවන් වේවි. ප්‍රදේශයේ ජනතාවගෙ උග්‍ර ආහාර අර්බුධය විසඳීමට යම් දායකත්වයක් ලබා දෙන්න මහජන නියෝජිතයන් හැටියට අපි වැඩ පිළිවෙලක් සැලසුම් කර දියත් කරමු යැයි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙය කාලෝචිත යෝජනාවක්. අපි ආණ්ඩු පක්ෂය හැටියට මේකට අනිවාර්යෙන්ම උදව් කල යුතුයි. මේ රට කෘෂිකාර්මික රටක්. පොහොර ප්‍රතිපත්තිය නිසා මේ රට ඉතාමත්ම අගාධයකට වැටුණා.අපි ප්‍රාදේශීය සභාවක් ලෙස ආණ්ඩු පක්ෂය, විපක්ෂය අපි හැමෝම මේ කාර්යය සඳහා එකතු විය යුතුයි. මෙය ඉතාමත් හොඳ වැඩක්.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙය ඉතා හොඳ යෝජනාවක්. අපේ සභාවට නැගී සිටින්න පුළුවන් අවස්ථාවක්. ප්‍රාදේශීය මට්ටමින් සභාවෙ ආදායම වැඩිකරගන්න උනත් පුළුවන් වේවි. වගා කරන්න පුළුවන් පැල කීපයක් තෝරගනිමු. මේ යෝජනාව, යෝජනාවකට පමණක් සීමා නොකර ක්‍රියාත්මක කරමු යැයි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ජයතිලක මන්ත්‍රීතුමා දක්ෂ ගොවියෙක්. කෘෂිකර්මාන්තය සම්බන්ධව ප්‍රාදේශීය සභා නිලධාරීන් විසින් බෝයවලාන සභාව සතු ඉඩමේ මේ වන විටත් වගා ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙනවා. ඒක අපි කාටත් සතුට කාරණයක්. බල ප්‍රදේශයේ වසම් 66 හි කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් දැනුම හා උනන්දුව ඇති පිරිස් සිටිනවා. මහජන නියෝජිතයන් හැටියට අපි හැමෝටම වගකීමක් තිබෙනවා ජයතිලක මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවට සහයෝගය ලබා දෙන්න. ඉක්මනින් මේ කටයුතු සිදුකරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉතාමත්ම කාලෝචිත හා ඉතාමත්ම වැදගත් යෝජනාවක්. මෙම යෝජනාව පක්ෂ භේදයකින් තොරව සභා සම්මත කලා. සභාවක් හැටියට අපිට හැකියාවක් තිබෙනවා වගා කිරීමට බීජ ලබා දෙන්න. එසේ නොමැති නම් වටිනා ත්‍යාගයක් ලබා දෙන්න. එමෙන්ම මම ගිය සභාවේ ප්‍රකාශ කල ආකාරයට ආහාර කල් තබා ගැනිමේ ක්‍රම තිබෙනවා. අපේ ගෙදර අටු කොස්, අටු දෙල්, වැලි කොස් ඇට වැනි දේ හදල තිබෙනවා. අපි ගමේ නායකයින් ලෙස මේ කටයුතුවල නිරතවෙලා ගම්වල ජනතාවට ආදර්ශයක් වෙන ගමන් සමාජය මේ දේවල්වලට පෙළඹවිය යුතුයි. අපේ සභාවේ අනුග්‍රහයෙන් කෘෂිබෝග ගෙවත්තක් හදන්න කෘෂිකර්ම පර්යේෂණ නිලධාරින්ගේ සහයෝගය අරගෙන කටයුතු කරන්න කියල මම යෝජනා කරනවා. ඒ වගේම මම ගෙදර කාබනික පොහොර මධ්‍යස්ථානයක් ආරම්භ කලා. තව නොබෝ දිනකින් මම අපේ මන්ත්‍රී මණ්ඩලයට ආරාධනා කරනවා අපේ නිවසට පැමිණ ඒ දේවල් දැක බලාගෙන මට තවත් උපදෙස් දෙන්න කියලා. ඒ වගේම ගරු සභාපතිතුමියට ආරාධනා කරනවා මේ කටයුත්ත තවත් දියුණු කරගන්න අත හිත දෙන්න කියලා. ජයතිලක මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට සියළු දෙනා ඒකමතිකව සහයෝගය දෙනවා. ජන ජීවිතය නගා සිටුවීමට තව නොබෝ දිනකින් මේ ගොවි තරඟය වගා වැඩසටහන ආරම්භ කිරිමට අපේ ශක්තිය ලබා දෙනවා. වටිනා දෙයක් අලව්ව ප්‍රාදේශීය සභාව විසින් ආරම්භ කලා කියල, ජනතාව අතරට යාමට හැකිවේවා කියල මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ජයතිලක මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව සියළුම දෙනා ඒකමතිකව සම්මත කලා. මේ රට කෘෂිකාර්මික රටක් හැටියට අද බොහෝ දෙනා නැවත වගාවට යොමුවෙලා තිබෙනවා. බෝයවලාන ප්‍රාදේශීය සභා ගෙවත්ත දැන් සුන්දර ගෙවත්තක් ලෙස නිර්මාණය වෙමින් පවතිනවා. මේ යෝජනාවට අනුව ගමක පවුල් 05ක් තෝරාගෙන ප්‍රාදේශීය සභාව මගින් කොම්පෝස්ට් පොහොර යම් ප්‍රමාණයක් හරි දීලා දිරිමත් කරනවා නම් ගමේ අනිත් අයත් වගා කරන්න හුරු වෙනවා. මේ යෝජනාව ඉතාමත්ම වටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**

ගරු සභාපතිතුමියනි, ජයතිලක මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ඉතාමත්ම අගය කරනවා. මමත් ගිය සභාවේ මේ ගැන කතා කලා. කාබනික පොහොර වගාව, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ගත් හොඳ තීන්දුවක්. අපි ගිය අවුරුද්දේ හිටපු සභාපතිතුමාගේ කාලයේ ගොවි තරඟයක් පැවැත්වූවා. එහිදී තැගි ලබා දුන්නා. මෙම වගා සංග්‍රාමය හොඳින් කරගෙන යන්න සියළු දෙනාගේ සහයෝගය ලැබෙයි කියලා මම හිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙය දූරදර්ශීව දැකලා ගෙන ආ යෝජනාවක්. එමෙන්ම එය සමස්ත රටේම ඇතිවිය යුතු දෙයක්. ඒ වගේම කොම්පෝස්ට් ව්‍යාපෘතිය කියන්නෙත්ගෝඨාභය මැතිතුමා ගෙන ආ හොඳ ව්‍යාපෘතියක් කියලා තමයි හවුල්කාර පක්ෂයක් ලෙස මම දකින්නේ. එමෙන්ම මේ රටේ ආර්ථිකය නගාසිටුවීම සඳහා ජාත්‍යන්තර වෙළඳපොල හරහා ඩොලර් උපයා ගැනීමට, පිටරට සිටින කර්මාන්තකරුවන්ට ශක්තියක් වීමට එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා යනුවෙන් ගෙන ආ වැඩපිළිවෙල යහපාලන ආණ්ඩුව කාලයේ ගත් හොඳ තීන්දුවක්. නමුත් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වුනා. මෙම වැඩපිළිවෙලේ හොඳ දේවල් හොඳ විදියට දැකිය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ජයතිලක මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. ඒ යෝජනාව සඳහා අප සියළු දෙනාගේ සහයෝගය ලබා දෙනවා. අපි ගෙවතු වගා තරඟයකට යනවා නම් ඉතාමත්ම කෙටිකාලීනව අස්වැන්නක් ලබා ගැනීමට හැකි බෝග තෝරාගත යුතුයි. මේ වෙනකොට ජනතාව ඉතා පීඩාවට පත් වෙලා ඉන්නේ. අපේ ප්‍රදේශවල පසුගිය කාලයේ ආර්ථිකයට සහනයක් වෙන්න සහනාධාරයක් ලබා දුන්නා. මෙම ක්‍රියාවලිය සිදු වුනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ගමේ සිටින රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ කරගෙනයි. ඇත්ත වශයෙන්ම ලැබිය යුතු අයට මේක ලැබිලා නෑ. මෙය ලැබිය යුතු ක්‍රමවේදය මොකද්ද කියලා දන්නේ නෑ. ඒ නිසා ප්‍රාදේශීය ලේකම්තුමියගේ අවධානයට මෙම කාරණය යොමු කරන්න කියලා ඔබතුමියගෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,මේ සම්බන්ධව අදහස් දැක්වූ සියළු දෙනාට මගේ පෞද්ගලික ස්තූතිය පුද කර සිටිනවා. මේ කාර්යය තවත් අර්ථ ගැන්විය හැකි ප්‍රධාන ආයතන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගොවිජන සේවා කාර්යාලය, පොලිස් ස්ථාන දෙක සම්බන්ධ කරගෙන පුළුල් විදියට මෙය ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් ගොඩක් හොඳයි. එමෙන්ම මහජන නියෝජිතයන් ලෙස අපිත්, රාජ්‍ය නිලධාරීනුත් සම්බන්ධ කරගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කල හැකි නම් ඉතාමත් ආදර්ශයක් වේවි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
මෙය ඉතාමත් කාලෝචිත යෝජනාවක්. දැනට නිලධාරීන් විසින් සභාව සතු ඉඩමක් වගා කරමින් පවතිනවා. මෙය මන්ත්‍රීතුමන්ලාගේ යෝජනාවක්. එමෙන්ම මෙය මහජන නියෝජිතයින් ලෙස මහජනතාවට තවත් සමීප වීමට හොඳ අවස්ථාවක්. මේ සඳහා මන්ත්‍රීවරුන්ගෙන් කමිටුවක් පත් කරලා සැලැස්මක් හැදුනොත් හොඳයි කියලා මම යෝජනා කරනවා. සභාවේ නිලධාරීන්ගේ සහයෝගයත් මේ සඳහා ලබා ගන්න පුළුවන්. ඉක්මනින්ම එම සැලැස්ම සකස් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙයට වැඩි ප්‍රචාරයක් දෙනවා නම් හොඳයි. ගම් වල සිටින කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීනුත් මෙයට සම්බන්ධ කරගෙන ප්‍රධාන නගර වල දැන්වීම් කිහිපයක් සවි කර මන්ත්‍රීවරුන්ටත් පෝස්ටර් කිහිපයක් ලබා දීලා ප්‍රචාරණය කරන්න පුළුවන් නම් හොඳයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
කමිටුවක් ස්ථාපිත කරලා මෙය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව මුලින්ම සැලසුම් කල යුතුයි. පළමුවෙන්ම පැල හොයාගන්න ක්‍රමවේදයක් හදාගන්න අවශ්‍යයි. අපි වෙනත් ආයතන සම්බන්ධ කරගැනීමට පෙර අවශ්‍ය මූලික පියවරයන් ටික සකස් කරගැනීමට කමිටුවක් පත් කරගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පහත සඳහන් මන්ත්‍රීවරුන් කමිටුව සඳහා පත් කිරීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා

7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙම කමිටුවේ සභාපති ලෙස ජයතිලක මන්ත්‍රීතුමා පත් කිරීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
ගරු මන්ත්‍රීවරුනි එසේ නම් අදාළ කමිටුව රැස්වෙලා සාකච්ඡා කර සභාවට ඔබතුමන්ලාගේ සැලසුම් ලබා දෙන්න

ඒ අනුව ආර්ථික විද්වතුන් ප්‍රකාශකරන පරිදි ඉදිරියේදි අප රටේ ඇතිවිය හැකි උග්‍ර ආර්ථික අර්බුදයට යම් පිළිසරණක් වීමේ අරමුණින් අප සභා බල ප්‍රදේශය තුල ගෙවතු වගා තරඟයක් ආරම්භ කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පහත යෝජනා දෙකම අද රටේ තියෙන දේශපාලන තත්වය මත පාර්ලිමේන්තුව ස්ථාපිත වූ පසු ඊලඟ සභා වාරයේ න්‍යාය පත්‍රයට යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**(05-22)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/52 - 22 දරණ යෝජනාව</u>**
ගොවි ජනතාව විසින් වගා කරනු ලබන පොල්- පළතුරු ඇතුළු විවිධ බව බෝගයන් ගෙන් හරි අඩකටත් වඩා විනාශ කරනු ලබන දඬු ලේනුන්, රිලවුන්, වල් ඌරන්, ඉත්තෑවන් හා මොනරුන් වැනි සතුන්ගෙන් වන හානිය අවම කරවීම සඳහා විධිමත් වූ පොදු වැඩපිළිවෙලක් දීප ව්‍යාප්තව නොපමාව දියත් කරවීමට මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී අමාත්‍යතුමන් හාගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු දේශපාලන පක්ෂ නායකතුමන්ලාගේ අවධානයට යොමු කරවීම සුදුසු බවට යෝජනා කරමි.

**(05-23)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/52 - 23 දරණ යෝජනාව</u>**
අප රට පත්වෙමින් යනු ලබන උග්‍ර ආර්ථික හා දේශපාලනික අවාසනාවන්ත තත්වයෙන් අප රට හා අනාගත පරපුර එයින් මුදවා ගැනීම සඳහා ඉදිරි මැතිවරණයකට ප්‍රථම පොදු ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කරවීමට අවශ්‍ය පියවර නොපමාව ගත යුතු බවට, සියළු දේශපාලන පක්ෂ නායකයින්ගෙන් හා එම පක්ෂවල ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිය යුතු බවට යෝජනා කරමි.

ඒ අනුව ඉහත යෝජනා ගරු මන්ත්‍රීතුමන්ගේ ඉල්ලීම පරිදි ලබන සභාවේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

**(05-24)**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා මැතිතුමා විසින් කරනු ලබන අංක **06/52 - 24** දරණ යෝජනාව</u>

හුම්බුළුව කොට්ඨාශයේ 2022 වර්ෂයේ අයවැය සඳහා ඉදිරිපත් කර තිබූ යෝජනාවක් වන ජයම්වත්ත කුසුමා මහත්මියගේ නිවස අසල සිට පහළට මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමේ යෝජනාව රටේ පවතින තත්වය සහ ද්‍රව්‍ය මිල අධික ලෙස ඉහල යාම හේතුවෙන් එය සිදු කිරීමට අපහසු බැවින් එය හුම්බුළුව බටහිර මැදගංගොඩ මාර්ගයේ වෙල කොටස බොරළු දමා සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ජයම්වත්ත කුසුමා මහත්මියගේ නිවස අසල සිට පහළට මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමේ සංවර්ධන යෝජනාව හුම්බුළුව බටහිර මැදගංගොඩ මාර්ගයේ වෙල කොටස බොරළු දමා සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.** <u>ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම - නැත</u>

<u>**07.**නිවාඩු ලිපි ඉදිරිපත් කිරීම</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද දින සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා හට අද දිනය නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

<u>**08.**කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>

<u>**(08.1)** මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව</u>

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.07.04 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.07.04 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.07.04 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>09. ප්‍රා.ස. 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව හා ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කිරීම</u>**

**<u>9.1 ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූනි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූනි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාවපිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූනි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මතවිය.

**<u>9.2 ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව</u>**
**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූනි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූනි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූනි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, රටේ පවතින ඉන්ධන අර්බුදය නිසා අපි සියළු දෙනාම ඉතාම අපහසුතාවයකට පත් වී සිටිනවා. සභා බලප්‍රදේශයේ ඉන්ධන පිරවුම්හල් 05 ක් තිබෙනවා. ඒ නිසා ජනතාව අතරත් ඉන්ධන අර්බුධයට කුමක් හෝ විසඳුමක් නැද්ද යන ගැටළුව තිබෙනවා. රාජ්‍ය ආයතන සියල්ල එකතු වෙලා කාටත් අපහසුතාවයක් නොවන ආකාරයට ඉන්ධන

අර්බුධයට පිළියමක් හදන්න බැරිද. ඒත් එක්කම බෝයවලාන ප්‍රදේශය බැලූ විට බෝයවලාන නගරයත් වරිපණම් බදු ගෙවන ප්‍රදේශයක්. නගරබද වරිපනම් බදු ප්‍රදේශවල බදු ටික සම්පූර්ණ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපිට ලඟම පිරවුම්හල සමූපාකාර පිරවුම්හලයි. අපේ මන්ත්‍රීවරුන්ට තෙල් යම් ප්‍රමාණයක් ලබා ගැනීමට ක්‍රමවේදයක් හදන්න කියලා පිරවුම්හලේ සභාපතිතුමා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලයට අපි යෝජනාවක් ඉදිරිපත් කල යුතුයි. ඒ සම්බන්ධව අපි ඉල්ලීමක් කරමු.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මම ප්‍රාදේශීය ලේකම්තුමියට කිහිපවරක් කතා කලා. එහිදී පළාත් පාලන ආයතන සඳහා ඉන්ධන ලබා දීම සම්බන්ධයෙන් එතුමියට බලය පවරා දීමක් සිදු වී නොමැති බව එතුමිය සඳහන් කලා. ඩිපෝවේ තෙල් ලබා දෙන දවසට බලප්‍රදේශයෙන් පිට බස් තමයි වැඩියෙන් තිබෙන්නේ. සභාවේ වාහන වලටත් එකම අවස්ථාවක තෙල් ලබා දෙන්නේ නෑ. අපි එකතු වෙලා සභාවක් හැටියට ඉදිරියට යාමට අවශ්‍ය නිසා තමයි මම සර්වපාක්ෂික කමිටුවක් හදමු කීවේ. තෙල් බෙදා දෙන ආයතන දැනගත යුතුයි තමන්ගේ ආයතනයේ කසළ ටික හරි ගන්න ආයතන වලට තෙල් ලබා දෙන්න. ආයතන අතර සහයෝගය තිබිය යුතුයි. මම සමූපාකාරයටත්, ඩිපෝවටත් කතා කලා. දෙන්නම් කියනවා මිසක් ලබා දෙන දවසක් නෑ. අපේ මන්ත්‍රීවරුන්ට තෙල් ටිකක් ලබා ගන්න වැඩපිළිවෙලක් සකස් කර දෙන්න කියලා, රාජකාරී මට්ටමින් ඉහළම කෙනාට කතා කලා. නමුත් එයටත් නිසි පිළිතුරක් ලැබුනේ නෑ. එහෙත් තවම උත්සාහය අතහැරලත් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, යහපාලන ආණ්ඩුව සමයේ මම සංවිධායකවරයා හැටියට ප්‍රදේශයේ රාජ්‍ය ආයතන සියල්ල එකතුවෙලා මාසයකට එක් වතාවක් සාකච්ඡාවක් පැවැත්වූවා. එහිදී රාජ්‍ය ආයතන සියල්ල එකට එකතු වෙලා තීන්දු තීරණ ගත්තා. කිසිම ආයතනයක් වැටෙන්න දුන්නේ නෑ. නමුත් වර්තමානයේ සමූපාකාර පිරවුම්හල සම්බන්ධයෙන් බරපතල ගැටළු රාශියක් තිබුනා. කෙසේ හෝ එම ඉන්ධන පිරවුම්හල සම්බන්ධ ගැටළු විසඳා ගැනීමට අපිට හැකියාව ලැබුණා.

එමෙන්ම රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවසට ගිනි තැබීම ගැන කතා කල යුතුයි. එතුමාගෙන් අපිට ඉගෙනගන්න දෙයක් තිබුනා. ඔහුගේ ඉඩම පවා ජීවිත භුක්තිය යටතේ රාජකීය විද්‍යාලයට ලියලයි තිබුනේ. මැයි 09 අරගලයෙන් පසු මේ සභාව රැස්වූ අවස්ථාවේ මම කීවා මහජන නියෝජතයන් හැටියට මෙහි ඊලඟ ප්‍රතිඵලය අපි සියළු දෙනාට විඳින්න වෙනවා කියලා. මහජන නියෝජිතයන් ලෙස අපි සියළු දෙනා පත්කලේ මහජනතාවගේ ප්‍රශ්න ගැන කතා කරන්න විනා අපේ ප්‍රශ්න ගැන කතා කරන්න නොවෙයි. ඒ නිසා මම මේ  අවස්ථාවේ මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. රටේ ජනතාව වෙනුවෙන් ජපන් ජයිකා ආධාර භාවිතා කරලා, මේ රටේ ඉංග්‍රීසි අධ්‍යාපන ක්‍රමය නැවත ස්ථාපිත කරලා, මේ රටේ විද්‍යා පීඨ හදපු, යොවුන් සේනාංක හදපු, යමක් කලා නම් එය දිගටම පවත්වාගෙන ගිය පුද්ගලයෙකුගේ නිවසක් තමයි මේ ගිනි තිබ්බේ. ජනාධිපති මන්දිරය වුවත් දැන් අනාරක්ෂිතයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ තෙල් අර්බුදය ගැන කතා කිරීමේදී, මම සමූපාකාර සභාපතිතුමාට කතා කලා මන්ත්‍රීවරුන්ට තෙල් ලබා ගැනීමට ක්‍රමවේදයක් නැද්ද කියලා. ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමිය මගින් ලැයිස්තුවක් එවන ලෙසත් එවිට තෙල් එන වෙලාවට මන්ත්‍රීවරුන් තෙල් ලබා දෙන ක්‍රමවේදයක් සකස් කරගත හැකි බවත් එතුමා මට කීවා. මේ සඳහා පැහැදිලි වැඩපිලිවෙලක් සකස් කල යුතුයි කියලා මම යෝජනා කරනවා. ඒ වගේම රටේ අග්‍රාමාත්‍යතුමා, වැඩ බලන ජනාධිපතිතුමා ගැන අපි විශේෂයෙන් කතා කල යුතුයි. එතුමා මම දැකපු විශේෂ චරිතයක්. වටිනා පොත් මෙන්ම අවුරුදු ගණනක් පැමිණි චිත්‍ර එතුමා ලඟ තිබිලා තියනවා. ඒවා සියල්ල ගිනිබත් වෙලා. මේ රට යන්නේ නරක දිශාවකට. ඊයේ සලකුණ වැඩසටහනේ කියනවා

මේ රට කාටවත් කරන්න දෙන්නේ නෑ කියලා. මෙය ඉතා භයානක තත්වයක්. අපි නිහඬව හැකිලිලා, නිවටව, අපේ මතවාද කතා නොකර පැත්තකට වෙලා ඉන්න තාක් කල් අපි ප්‍රජාතන්ත්‍රවාදය වැලලීම සඳහා උදව් කරන පිරිසක් බවට පත් වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ දිනවල ලංගම ඩිපෝවෙන් තෙල් ලබා දෙනවා. මෙහිදී තෙල් ලබා දෙන විට සහකාර කළමණාකරතුමා මෙහි ලොකු අක්‍රමිකතාවක් සිදුකරන බව පෙනෙන්නට තිබෙනවා. මේ ප්‍රදේශයේ ජන ජීවිතය යතාවත් කරන්න නම් ප්‍රදේශයේ පොදු ප්‍රවාහනයට තෙල් ලබා දිය යුතුයි. නමුත් ප්‍රදේශයේ පොදු ප්‍රවාහනයට තෙල් නොදී වෙනත් පිට වාහනවලට තෙල් ලබා දෙනවා. මේක ප්‍රදේශයේ පොදු ප්‍රවාහනයට ප්‍රශ්නයක්. මේ පිළිබඳ ඔබතුමියගේ අවධනය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

අනෙක් කරුණ තමයි වීථි ලාම්පු පිළිබඳ ගැටළුව. තවමත් අක්‍රිය වූ වීථි පහන් ක්‍රියාත්මක කරලා නෑ. ඒ පිළිබඳ වැඩපිළිවෙලක් තිබෙනවාද කියලා දැනගන්නත් කැමතියි. එමෙන්ම ඉදිරියේදී ගම්වල ජනතාවට සහනාධාර වැඩපිළිවෙලක් ලබා දෙනවා නම් ගැබිණි මව්වරුන්ටත්, කුඩා දරුවන් සිටින මව්වරුන්ටත් ප්‍රමුඛතාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. මේ වනවිට ගැබිණි මව්වරුන්ට අවශ්‍ය යකඩ පෙති, විටමින් වර්ග, කුඩා දරුවන්ට ලබා දෙන ත්‍රිපෝෂ කිසිවක් නෑ. ඒ පැත්ත සම්පූර්ණයෙන්ම බිඳ වැටිලයි තිබෙන්නනේ. රටේ පවතින අරගලකාරී තත්වය විසඳුනාට පසු ඒ ආයතන දැනුවත් කරලා කඩිනම් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගියදා අරගලකරුවන් කියාගත් පිරිසක් ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිවසට ගිනිතැබීම සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරනවා. ඒත් එක්කම සමූපාකාර පිරවුම්හලේ අක්‍රමිකතාවන් සිදු වුනා. එය රහසක් නොවෙයි. සියළු දෙනාම දන්නා කරුණක්. එමෙන්ම මේ ප්‍රදේශයේ පසුගිය කාලයේ නිවාස ගිනි තැබුවා. ඒවා මෙහෙයවල තිබෙන්නෙත් දේශාපාලඥයන්ම තමයි. ඔවුන් ඒ විනාශ කලේ මුළු මහත් ශ්‍රී ලාංකික මහජන නියෝජතයින්ගේ නිවාසයි. මෙවැනි කටයුතු ඉදිරියේදී සිදු නොවෙන්නට සියළු දෙනාම ඉතාම වගකීමෙන් කටයුතු කරමු යැයි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විශේෂයෙන්ම අපේ පක්ෂ නායකතුමාගේ නිවසට ගිනි තැබීම පිළිබඳව මගේ කණගාටුවත් ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අපි කතා කරපු ප්‍රජාතන්ත්‍රවාදය මුල් වුන රටේ පළමුවෙන්ම ආර්ථිකය කඩා වැටුනා. ඊලඟට නීතියේ ස්ථාවරභාවය බිඳවැටීම මෙන්ම දේශපාලන අස්ථාවරභාවයක් ඇතිවෙලා තිබෙනවා. මේ ක්‍රියාවලිය යටතේ සමහර ආයතන වල නිලධාරීන් තීන්දු තීරණ ගැනීමට නොහැකිව අසරණ වී තිබෙනවා. මේ කාල සීමාවේ අපි සියළු දෙනා බොහෝ ඉවසිල්ලෙන් කටයුතු කල යුතුයි.

ඒ සමඟම විශේෂිත කාරණයක් කිව යුතුයි. අප ආයතනයේ සේවය කල නිලධාරීන් කිහිප දෙනකුට ස්ථාන මාරු ලැබිලා තිබෙනවා. ඒ අතර මෙතෙක් කල් සභා කටයුතු සිදු කල සංවර්ධන නිලධාරී චූලනී ජයදේව මහත්මියට අලව්ව ප්‍රාදේශීය රෝහල වෙත ස්ථාන මාරුවක් ලැබිලා තිබෙනවා. ඇය විවිධ දේ ඉවසා දරාගෙන සිටියා. සභා කටයුතු සිදු කිරීමේදී ඉතා හොඳින් වාර්තාව සකස් කලා. එතුමියට අපි සුභ ප්‍රාර්ථනා කරනවා. මෙතන නොසිටියත් චත්සලා ජයසිංහ මහත්මියත් සභාව පටන්ගත් දවසේ සිට මේ දක්වා අපිත් එක්ක හොඳින් කටයුතු කලා. එතුමියටත් ස්ථාන මාරු ලබන අනිත් නිලධාරීන්ටත් සුභ ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ සභාවේ මේ කාල පරාසය තුල චූලනී මහත්මිය සිනාමුසු මුහුණින් යුතුව මහජන නියෝජිතයින් ලෙස අපි පැමිණි විට බොහොම කුළුපගව සුහදව කටයුතු කල නිලධාරිනියක්. බොහෝ අත්දැකීම් රාශියක් සමඟ තමයි එතුමිය ප්‍රාදේශීය රෝහලට යන්නේ. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවක කාර්යභාරය පිළිබඳව එතුමිය අවබෝධ කරගෙන තිබෙනවා. ප්‍රාදේශීය සභාව තුල සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය මෙන්ම පරිපාලන නිලධාරී ලෙස ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය සමඟ සුහදත්වයෙන් යුතුව කටයුතු කිරීමේ ගුණාංගය ඇයට තිබුණා. යහපත් දෙමව්පියන්ට දාව ලැබුණු දරුවෙක් ලෙස උසස් අධ්‍යාපනය හදාරලයි රැකියාවට එන්නේ. එවිට තමන් සේවය කරන ආයතනය තුල ගෞරවනීය සහ අභිමානවත් ආකාරයට කටයුතු කල හැකියි. මහජන නියෝජිතයින් සහ මහජනතාව වැඩියෙන්ම සේවා ලබා ගන්නා මෙන්ම වැඩියෙන්ම ගැටළු අරන් එන ස්ථානයක සේවය කර ඔබ ලැබූ පන්නරය, ඔබට හොඳ ගමනක් යාමට හැකි යැයි මම විශ්වාස කරනවා. ඔබේ ඉදිරි සේවා කටයුතු වලදී ඒ සේවා ස්ථානලින් එන යම් යම් ප්‍රශ්න, පීඩන වලට සිනාමුසු මුහුනින් යුතුව මුහුණ දීමට ඔබ මේ පරිසරය තුලදී හැඩගැසුනා. ඒ නිසා විශේෂයෙන්ම ඔබ වැනි දක්ෂ නිලධාරිණියක් අපෙන් ඈත්ව යාම අපටත්, අපේ සභාවටත් පාඩුවක්. අපත් සමඟ සහෝදරියක් ලෙස කටයුතු කර අද අපෙන් සමුගන්නා විට අපිට කණගාටුවක් තිබෙනවා. නමුත් අලව්ව ප්‍රාදේශීය සභාව තුල කටයුතු කල කාල පරාසය තුල මූලාසනයට ගරු කරමින් මහජන නියෝජිතයන් සමඟ බොහොම සුහදව කටයුතු කිරීම සම්බන්ධයෙන් අප සතුටු විය යුතුයි. ඉදිරියේදී ඔබ තබන්නා වූ සෑම පියවරක්ම සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරනවා. ඔබට උතුම් වූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේත්, දළඳා හාමුදුරුවන්ගේත් ආශිර්වාදය පිහිට ලැබේවා. එමෙන්ම ඔබට සුභ ගමනක් ප්‍රාර්ථනා කරමින් අපේ ගෞරවය පුද කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි සමඟ එකට දීර්සකාලයක් කටයුතු කර අපේ අසල්වාසී රෝහලට යන මෙතුමියගෙ මම දැකපු විශේෂ ගුණාංගයක් තමයි ගෞරවනීය රාජ්‍ය සේවයක් කරනව වගේම උපතින්ම ලැබුණු බොහොම නිහතමානී නිරහංකාර බවක් මෙතුමියගෙ ස්වභාවයෙන්ම තිබෙනවා. ඒක හැමදාමත් තියෙන කෙනෙක්. අඩුවෙන් කතා කරමින් තමන්ගේ කටයුත්ත මැනවින් අකුරටම ඉටු කරන බවක් මම දැකල තිබෙනවා. අනවශ්‍ය දේ කතා කරන්නේ නෑ. හොඳ යහපත් ගුණගරුක භාවයක් එතුමියගෙ තිබෙනවා. යහපත් විධියට හැදුණු යහපත් දෙමව්පියන්ගෙ දරුවො. ඔබ කටයුතු කලේ සෑම ක්ෂේත්‍රයක්ම බද්ධවෙලා තිබෙන මේ පළාත් පාලන ආයතන තුල. ඒ සියල්ල අත්දැකීම් ලෙස ලබාගෙන ඒ අත්දැකීම් එක්ක හොඳ ප්‍රියජනක රාජ්‍ය නිලධාරිනියක් වගේම රාජ්‍ය සේවයේ තිබෙන ගෞරවනීය බව ආරක්ෂා කර ගන්න පුළුවන් නිලධාරිනියක්. ඔබ විශ්‍රාම යන දිනයට ඒ පිළිබඳ සතුටුවෙන්න පුළුවන් පෙර නිමිති පහල වෙලා තිබෙනවා කියන එක විශේෂයෙන් මතක් කරමින් ඔබගේ රාජකාරි ජීවිතයට හා අනෙකුත් කාර්යන්ට අපි සුභ පතනවා වගේම ඔබට නිරෝගී දිවියක් ප්‍රාර්ථනා කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, චූලනී මහත්මිය ආයතන අංශය නියෝජනය කරමින් විශේෂයෙන් සභා කටයුතු කරමින් සභාවේ වාර්තා සියල්ල සකස් කලා. ඊට අමතරව රාජකාරි කටයුතු කරන විට ඉතාම කැපවීමෙන් කටයුතු කලා. ඒ වගේ චරිත හරි අඩුයි. මම දැක්ක ඉතාම කලාතුරකින් එහෙම නිලධාරින් සිටිනවා. එහෙම නිලධාරින් අතරට යන කෙනෙක් තමයි චූලනී මහත්මිය. එතුමිය හොඳ අවංක නිලධාරිනියක්. මම එතුමියට සුභ ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ස්ථාන මාරු ලැබ යන චූලනී මහත්මිය තමන්ගෙ රාජකාරිය නියමාකාරයෙන්ම කල නිලධාරිනියක්. ලක්ෂ ගානක් රාජ්‍ය නිලධාරින් අතර උගත් භාවයෙන්

වගේම නැණගුණ දෙකම තිබෙන රාජ්‍ය නිලධාරිනියක්. එතුමියගෙ සියළු කටයුතු සාර්ථක කර ගැනීමට ශක්තිය, ධෛර්ය ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ස්ථාන මාරු ලැබ යන චූලනී මහත්මිය රාජකාරි කාලය තුළ කිසිවෙකුගේ සිත් රිදවීමක් කර නෑ. සභාව නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාගේ ගෞරවය ආරක්ෂා වන ආකාරයට කටයුතු කලා. ස්ථාන මාරු ලබා යන ස්ථානයේ මීට වඩා ලොකු වගකීමක් තියෙන්න පුළුවන්. එම කටයුතු සාර්ථක කර ගැනීමට ශක්තිය, ධෛර්ය ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා.

ඒත් සමඟම තවත් කාරණයක් තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එතුමාගේ පාලන කාලය හොඳින් කරගෙන ගියා. එතුමන්ලා සිදුකල කාර්යට අපි සියළු දෙනා ස්තුතිවන්ත විය යුතුයි. ඉදිරියේදී ජනාධිපතිතුමා ධූරයෙන් නික්ම ගිය පසු ස්තුති කිරීම් කරල වැඩක් නෑ. ඒ නිසා මේ අවස්ථාවේ මම එතුමාට ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

එසේ නම් අපි අපේ චූලනී මහත්මියට නැවත වරක් අපේ ආදරය ගෞරවය පුද කරමින් සුභ ප්‍රාර්ථනා කරමු.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා.

අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 3.00 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2022/07/12
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.